www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නව සාමාන්‍යය

## The new normal

**2010 ජුලි 14**

ග්‍රීක නය අර්බුදයෙන් කුලු ගැන්වී ලෝක කොටස් වෙලඳපලවල් ඇලලී ගිය භීතිය නවතා ලූ යුරෝ බිලියන 750 ක යුරෝපීය ඇපදීම ප්‍රකාශයට පත් කිරීමෙන් මාස දෙකකට පසුව පැහැදිලි වන්නේ මෙම ඇපදීම වනාහී යුරෝපීය හා ජාත්‍යන්තර දේශපාලනය තියුනු නව දිශානුගත කිරීමේ අවස්ථාවක් වූ බවයි. ආර්ථික අර්බුදය තාවකාලික මුලාවක් යයි කියූ ප්‍රකාශයන් පැත්තකින් තැබුනි. ඒ වෙනුවට, කම්කරු පන්තියේ අඛන්ඩ දිලිඳුභාවය "නව සාමාන්‍ය" බවට පත් වී ඇත.

ඇපදීම සූදානම් කරනු ලැබුවේ කම්කරු පන්තියේ විරුද්ධත්වයට බිය වී කොටස් වෙලඳපලේ කොටස් අඩු මිලට විකුනාදැමීම හා ග්‍රීසියේ හා ජාත්‍යන්තර නය කෙසේ සකසා ගන්නේ ද යන්න පිලිබඳව ප්‍රධාන යුරෝපීය බලවතුන්ගේ දරුනු කුලල් කාගැනීම් නතර කිරීම සඳහා ය. එය සූදානම් කරන ලද්දේ වෙන විකල්පයක් නොමැති නම් ප්‍රන්සය යුරෝව අතහරින බවට තර්ජනය කිරීමෙන් පසුව ය. දෙවන ලෝක යුද්ධය පුපුරා යෑමෙන් පසුව යුරෝපයේ රාජ්‍යයන් වඩාත් ආතති සහගත වූ බවට යුරෝපීය මහ බැංකු ප්‍රධානී ජීන්-ලවුඩ් ට්‍රිචට් අනතුරු ඇඟවූයේ ය.

පොදු මුදල අවලංගු කිරීමෙන් යුරෝපීය වෙලඳාමේ බිඳවැටීමක්, ජර්මානු අපනයනයන්හි කඩා වැටීමක්, ප්‍රන්ස-ජර්මන් යුද්ධයක පවා හැකියාව ගැබ් කර ගත් ඓන්ද්‍රීය අන්තරායන් පිලිබඳව සිතා බැලූ පාලක පන්තීන් යුරෝවේ සුරක්ෂිතභාවය කම්කරුවන්ගේ කර මතින් යැවීමට තීන්දු කලේ ය.

මහා බැංකුවලට තවත් සුවිශාල ප්‍රදානයක් වූ සමස්ත ඇපදීම යලි පියවා ගැනීමේ අරමුදල් ගලා එන්නේ සත්තකින්ම පෙරනොවූ විරූ පරිමානයේ සමාජ කප්පාදු තුලින්ය. බ්‍රිතාන්‍යයේ ස්ථාපිත කල කන්සර්වේටිව්-ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී සභාගය මැයි මාසයේ දී මෙම තීන්දුව ස්ථිර කල අතර ගිය මාසයේ ටොරොන්ටෝවල පැවති ජී-20 සමුලුවේ දී මහා බලවතුන් නිල වශයෙන් එය අනුමත කලේ ය. ජී-20 ප්‍රකාශය පෙන්වා දුන්නේ "බරපතල මූල්‍ය අභියෝගයන්ට මුහුනපා ඇති රටවල් ස්ථාපිත වීමේ වේගය වැඩි කල යුතු බවයි." එහි තේරුම වන්නේ අය-වැය කප්පාදු ය.

කම්කරුවන් සති පතා නව කප්පාදුවලට මුහුන දී සිටින ග්‍රීසිය හා ස්පාඤ්ඤය වැනි කඩා වැටුනු ආර්ථිකයන්ගෙන් එහාට කප්පාදු පිලිවෙත් ව්‍යාප්තව ඇත. බටහිර ලෝකය පුරාම සමාජ ජීවිතය ප්‍රතිවර්තනය කිරීම ඒවායේ අරමුනයි.

බ්‍රිතාන්‍යයේ දී පවුම් බිලියන 85 සිට 100 අතර කප්පාදු, මිලියන 1.3 රැකියා අහිමිවීම, නිවාස අහිමි වූවන්ගේ නාටකාකාර වැඩි වීමක්, යටිතල පහසුකම් නඩත්තුවේ හා මහජන සේවාවන්හි බිඳ වැටීමක් සහ සියයට 25 ත් 40 අතර ප්‍රමානයකින් ප්‍රාන්ත ආන්ඩුවල අයවැය කැපීමට තුඩුදෙනු ඇත. මූල්‍යමය වශයෙන් ශක්තිමත්ම යුරෝපීය රාජ්‍යය වන ජර්මනිය සිය අයවැය හිඟය යුරෝ බිලියන 80 කින් කැපීමට සැලසුම් කර ඇත.

ප්‍රන්සයේ දී බරපතල විශ්‍රාම වැටුප් කප්පාදු හා ප්‍රාන්ත ආන්ඩුවල ප්‍රතිපාදන සියයට 10න් අඩු කිරීමට සැලසුම් කල නිකොලායි සාර්කොසි ඒ අතර වාරයේ දී, ලිලානි බෙටන්කෝට් වැනි බිලියනපතියන්ට යුරෝ මිලියන 30 ක බදු සහනයන් ප්‍රදානය කලේ ය.

පිලිවෙත්වල මෙම පුලුල් මාරුවේ අර්ථභාරය එක්සත් ජනපද ආන්ඩුවේ රැකියා විරහිතයන්ගේ සුභසාධන දීර්ග කිරීම ප්‍රතික්ෂේප කිරීම මගින් ඉස්මතු කරයි. එම තීන්දුව මිලියන සංඛ්‍යාත කම්කරුවන් දිලිඳුභාවයට ඇද දැමීමේ තර්ජනය මතු කර ඇත. ඒ වෙනුවට පසුගිය ජනවාරියේ දී ජනාධිපතිගේ ජාතික තත්ව වාර්තාව ගෙනහැර දැක්වූ කථාවේ දී නිවේදනය කල ජාතික අපනයන ප්‍රවර්ධනය ඔබාමා ඉදිරියට ගෙනැවිත් තිබේ. එක්සත් ජනපද අපනයන දෙගුන කිරීම අරමුනු කරගත් මෙම පිලිවෙත මගින් ඉහල ඵලදායිත්වයට ගැටගැසූ ඇමරිකානු කම්කරුවන්ට තියුනු ලෙස ඔවුන්ගේ වැටුප් කැටිකර ගැනීමටත්, චීනය, ඉන්දියාව හා වියට්නාමය වැනි දිලිඳු ම රටවල්වල ඔවුන්ගේ සගයන් සමග තරගයටත් බල කෙරී ඇත.

ඔවුන්ගේ පිලිවෙත් පලල් කම්කරු පන්තික විරුද්ධත්වයට මුහුන දෙනු ඇතැයි යන්න ගැන පාලක පන්තීන් දැනුවත් ය. එමනිසා ඔවුන්ගේ කප්පාදු වැඩසටහන් ආඥාදායකත්වය හා යුද්ධය යුක්තිසහගත කිරීමේ මාධ්‍ය ව්‍යාපාරයක් සමග එකට ගමන් කරයි.

සම්බන්ධීකරනය කල අයවැය කප්පාදුව, යුරෝපීය රාජ්‍යයන් අතර ගැටුම් තාවකාලිකව නවතා දමනු ලැබුව ද අධිරාජ්‍යවාදී රටවල් හා චීනය වැනි නැගීඑන බලයන් අතර ආතතිය තියුනු කලේ ය. ඒ අතර වාරයේ දී කප්පාදු පියවරයන්, අලුතින් කාර්මීකරනය වූ රටවල් හා සසඳන විට බටහිර රටවල ආර්ථික හා මූලෝපායික ශක්තිය හීන වීමට හා එමගින් ස්ථාපිත ජාත්‍යන්තර පර්යාය බිඳදැමීමට තර්ජනය කරයි.

*ෆිනෑන්ෂල් ටයිම්ස්* තීරු ලිපි රචක මාර්ටින් වුල්ෆ් මෙසේ පෙන්වා දුන්නේය: වේගයෙන් බාදනයට ලක්ව තිබෙන එහි තාක්ෂනික වර්ධනයේ වාසියට අමතරව "බටහිර රටවල් අවම වශයෙන් සිය කුලී අපේක්ෂාවන්, වඩාත් නිවැරදි ලෙස කිවහොත් ලෝකයේ ද්‍රව්‍යමය හා මානව සම්පත් කොල්ලකෑම එහි හිනි පෙත්තටම නංවා තිබේ."

මෙම තත්වයන් යටතේ, තම වරප්‍රසාද රැක ගැනීමට බටහිර මූල්‍ය වංශාධිපතීන් විසින් මිලිටරි බලය යොදා ගැනීමට පාලක පන්තීන් වෙත වැඩි වැඩියෙන් බලපෑම් කරනු දක්නට ලැබෙයි. මෑතක පලවූ *ඉන්ටර්නැෂනල් හෙරල්ඩ් ට්‍රිබියුන්* හි ලිපියකින් යුරෝපීය මිලිටරි වියදම් තවත් වැඩිකිරීම සඳහා කැඳවුම් කලේ ය. ලෝකය පුරාම නැගී එන චීනයේ ආර්ථික වැදගත්කම හේතුවෙන් ආසියාව "මූලෝපායික හිසරදයක්" ලෙස දැකගත යුතු බවට ප්‍රන්සයේ විදේශ ප්‍රතිපත්ති ප්‍රවීනයෙකු වන තෙරිසා ඩෙල්පිච් අනතුරු ඇඟවුවා ය. එක්සත් ජනපද-චීන ගැටුම හමුවේ යුරෝපය බීජිනයට එරෙහිව යුද්ධය දියත් කිරීමට සූදානම් විය යුතු යි, "උදාහරනයක් ලෙස මැදපෙරදිගින් චීනයට තෙල් ගෙනයන මූහුදු ගමන් ඇහිරීමෙන් ඊට උදව් විය හැකි" යයි ඇය තව දුරටත් ප්‍රකාශ කලා ය.

ටොරොන්ටොහි ජී-20 විරෝධතාවයන්ට එල්ල වු පොලිස් මර්දනය, කොලඹ සාමූහික පොලිස් වැටලීම, හා මැයි මාසයේ තායිලන්ත හමුදාවේ රතු කමිස විරෝධතාකරුවන් මත දියත්කල මැඩලීම මගින් පෙන්නුම් කර ඇති පරිදි අභ්‍යන්තර හා බාහිර විරෝධතාවන් ප්‍රචන්ඩ ප්‍රහාරයට ලක්ව තිබේ. මෙම මර්දනයට යටින් මෙවැනි පියවරයන් මගින් පමනක් සිය වරප්‍රසාද රැකගත හැකි බවට පාලක පන්තීන් තුල වැඩෙමින් පවත්නා හැඟීම ප්‍රකාශ කෙරෙයි.

*ග්ලෝබ් ඇන්ඩ් මේල්* හි මෑතම ප්‍රකාශයක් තුල කතු වැකි රචක නීල් රෙනොල්ඩ් සුභසාධන රාජ්‍යය තුල ප්‍රජාතන්ත්‍රවාදය සාමකාමී ලෙස බිඳ දැමිය හැකි ද යන ප්‍රශ්නයට පිලිතුර "නැත එසේ කල නොහැකිය" යන්න බව පැවසීය. ඉතාලිය වෙත අවධානය යොමු කරමින්, ඔහු ප්‍රකාශ කලේ රාජ්‍ය නය හා ආන්ඩුවේ වියදම් කැපීමට සමත් වූ ඉතිහාසයේ එකම බලය 1922 දී බලය ගත් මුසෝලිනිගේ ෆැසිස්ට් තන්ත්‍රය බව ය.

මෙවැනි ප්‍රකාශයන් ධනවාදයේ බුද්ධිමය දේශපාලනයේ හා සදාචාරයේ අර්බූදය ඉස්මතු කරයි. විසිවන සියවසේ පලමු භාගයේ ඇති කරන ලද දරිද්‍රතාවය හා ලේ වැගිරීම් හා සමාන යමක් යලිත් පනගැන්වීමට පවත්නා සූදානම එමගින් (ඉහත ප්‍රකාශයෙන්) හෙලිදරව් වෙයි. සමාජ වියදම් කැපීම හා යුද්ධය සඳහා ඔවුන්ගේ සූදානම තුල පාලක පන්තීන් සිය ආන්ඩු. රාජ්‍යය යනු පාලක පන්තීන්ගේ ද්‍රව්‍යමය ආසක්තයන් බලගැන්වීම අරමුනු කරගත් සන්නද්ධ මිනිස් සමුදායක්ය යන මාක්ස්වාදී නිර්වචනය පිලිබඳ පැහැදිලි අකාබනික නිදසුනක් බවට හරවා තිබේ.

පවත්නා දේශපාලන සංවිධාන ධනවාදයට එරෙහිව හා සමාජවාදය සඳහා අරගලයකට සතුරු මධ්‍යම පන්තික බොරුකාරයින් හෝ දක්ෂිනාංශික සමිති නිලධරය විසින් මෙහෙයවනු ලැබීමේ හේතුව කරනකොටගෙන මේ වනතෙක් කම්කරුවන්, සමාජ ප්‍රතිගාමිත්වයට හා යුද්ධයට සඵල ලෙස ප්‍රතිරෝධය දැක්වීමෙන් වලක්වා තිබේ. ග්‍රීසියේ හෝ ප්‍රන්සයේ කෙරෙන එක්දින "ජෙනරල් ස්ට්‍රයික්" පවා මහජන විරුද්ධත්වය රඳවා තබමින් හා දියකර හරිමින් කප්පාදු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට උදව් කරන වෘත්තීය සමිති නිලධාරීන්ගේ වංචනික දේශපාලන සටන් පමනි.

කම්කරුවන්ට පාලක පන්තියේ සමාජ ප්‍රතිගාමිත්වය හා යුද්ධය පිලිබඳ සැලසුම් වලට එරෙහි විය හැක්කේ මෙමෙ වංචනික සංවිධානවලින් බිඳී වෙන්වීමෙන් හා සමාජවාදය සඳහා විප්ලවවාදී අරගලය ඉදිරියට ගෙන යාමෙන් පමනි.

ඇලෙක්ස් ලැන්ටියර්

© www.wsws.org